සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 40 S I

නම: ...............................................

**පෙරදිග සංගීතය**

කාලය පැය එකයි

## I කොටස

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වලදී 1,2,3,4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

1) |ස ධ ප ධ | ම ප ග ම | නි ධ - ස | - රි ග ම | යන සර්ගම් ගී පාදය අයත් රාගය කුමක්ද?
I. භූපාලි II. භෛරවී III. බිලාවල් IV. කාෆි

02) ' ස ' ස්වරය සංවාදී ස්වරය ලෙස යෙදෙන නිර්දේශිත රාග යුගලය තෝරන්න.
I. යමන් - කාෆි II. බිලාවල් - භෛරවී III. කාෆි - භෛරවී IV. භෛරවී - භූපාලි

03) ගරිසධ සරිග පග ධපගරිස, යන මුඛ්‍යාංගය අයත් නිර්දේශිත රාගයට අදාළ නිවැරදි කියමන තෝරන්න.
I. බිලාවල් මේලගත රාගයකි. II. ගායන සමය රාත්‍රි දෙවන ප්‍රහරය වේ.
III. විකෘති ස්වර සියල්ලම යෙදෙන රාගයකි. IV. කල්‍යාණ මේලගත ශුද්ධ ස්වර යෙදෙන රාගයකි.

04) ප්‍රකෘති හා විකෘති ස්වර සියල්ලම යොදාගත හැකි රාගය මින් කුමක්ද?
I. භෛරවී II. යමන් III. බිලාවල් IV. කාෆි

05) මහනුවර යුගයේදී ප්‍රචලිත වූ ගායන විශේෂ දෙකක් ඇතුළත් පිළිතුර තෝරන්න.
I. වන්නම් - ප්‍රශස්ති II. හටන් - නාඩගම් III. නූර්ති - ප්‍රශස්ති IV. වන්නම් - නාඩගම්

06) කල්‍යාණ මේලගත නිර්දේශිත රාගයක විශේෂ ලක්ෂණයක් සඳහන් වන වරණය තෝරන්න.
I. කෝමල ධෛවතය පමණක් යෙදේ. II. තිව්‍ර මධ්‍යමය යොදා ගැනේ.
III. රි ග ධ නි ස්වර සියල්ලම යොදාගැනේ. IV. නිෂාදය විවාදී ස්වරයක් ලෙස යොදා ගැනේ.

07) තීව්‍ර මධ්‍යමය, මන්ද්‍ර කෝමල නිෂාදය, කෝමල ධෛවතය සහ උච්ච කෝමල ගාන්ධාරය යන ස්වර පිළිවෙලින් ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.
I. මʼ ධ නි ග II. ම ධ ගʼ නි III. මʼ නි ධ ගʼ IV. මʼ නි ගʼ ධ

08) දොළොස්මත් සේ ගී පාදය තෝරන්න.
I. රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙළදී දී විදුලිය පබා II. රුගත් සුරා පිරූ විතින්
III. මනමත් කරවන දන මුළු දෙරණා IV. පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට

09) සරිගප සරිගරි, රිගමධ රිගමග යන ස්වර අභ්‍යාසයේ හතරවන ස්වර කාණ්ඩය අයත් පිළිතුර තෝරන්න.
I. රිගමධ,රිගමප II. මපධසං මපධප III. ගමපනි මපධප IV. මපධනි මපධප

10) ඖඩව - සම්පූර්ණ ජාති රාගයක ආරෝහණ අවරෝහණ ස්වර සංඛ්‍යාව පිළිවෙලින් දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.
I. 5 - 7 II. 5 - 6 III. 7 - 5 IV. 6 - 7

11) රාගයක ආරෝහණ සහ අවරෝහණයෙහි නොයෙදෙන රාගය අලංකාර කිරීම සඳහා කලාතුරකින් යොදාගන්නා ස්වරය කුමක්ද?
I. සංවාදී ස්වරයයි. II. විවාදී ස්වරයයි. III. වාදී ස්වරයයි. IV. අනුවාදී ස්වරයයි.

12) බිලාවල්, කාෆි, යමන් සහ භෛරවී යන රාග හතරටම පොදු ලක්ෂණයක් ඇතුළත් වරණය තෝරන්න.
I. වාදී සංවාදී ස්වර සමානවීම. II. ගාන සමය සමානවීම.
III. විකෘති ස්වර යෙදීම. IV. සම්පූර්ණ ජාතියට අයත්වී ම.

13) තබ්ලා වාදනයේදී තනි අතින් හා දැතින්ම වැයෙන අවනද්ධ අක්ෂර පිළිවෙලින් ඇතුළත් වරණය තෝරන්න.
I. ධිං, ධා II. තිං, නා III. නා, ධා IV. ධි, නා

14) ''මටම පෙම්කළ නෙතග නිවැසෙන කඳුළු බින්දුව නුඹ තමා'' මෙම ගී පාදය ගැයීමට සුදුසුම හින්දුස්ථානී තාලය මින් කුමක්ද?
I. ජජතාලය II. දීප්චන්දි තාලය III. ත්‍රිතාලය IV. ලාවනී තාලය

15) පහත දැක්වෙන ගීත යුගලයන්ගෙන් නව නාට්‍ය සම්ප්‍රදායට අයත් ගීත යුගලය තෝරන්න.
I. ප්‍රේමයෙන් මන රංජිතවේ - ලෝනා මුණි රාජගේ
II. දීකිරි දීකිරි ගෙනාව දීකිරි - යස ඉසුරු පිරුණු තැනා
III. යස ඉසුරු පිරුණු තැනා -ජීවන මේ ගමන සංසාරේ
IV. ලෝනා මුණි රාජගේ - ගල්ලෙන බිඳලා

16) විෂමග්‍රහයෙන් ගැයෙන සුදුසු ගී පාදය තෝරන්න.
I. දන්නෝ බුදුන්ගේ II. සුවඳ පත්ම ඕලු ආදී
III. දුර පෙනෙන තැනිතලා IV. ආලේ බැන්ද මාගේ රම්‍යවන්

17) වන්නමක නාද මාලාව ආශ්‍රය කරගනිමින් නිර්මාණය වූ සරල ගීතය මින් කුමක්ද?
I. මිහිමඬලේ අඳුරු කුසේ II. ගමට කලින් හිරු
III. දුනුකෙයියා මලක් වගේ IV. රුක් අත්තන මල මුදුනේ

18) තාලයෙන් තොරව ගයන ''දොහොරාව'' නම් සංගීතාංගය ඇතුළත් ගීත විශේෂය කුමක්ද?
I. නූර්ති ගී II. කෝළම් ගී III. නාඩගම් ගී IV.සොකරි ගී

19) '' රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙල දිදී විදුලිය පබා'' මෙම ගී පාදයේ සැඳැස්මත් ගණන,
I. දොළහක් වේ. II. දහඅටක් වේ. III. විසිහතරක් වේ. IV. විසිහයක් වේ.

20) ගැමි ගීත වලට අයත් නොවන ලක්ෂණය මින් කුමක්ද?
I. සරල බස් වහරක් තිබීම. II. ග්‍රන්ථාරූඪ කර තිබීම.
III. ස්වර ක්ෂේත්‍රය පටුවීම. IV. කාර්යානුබද්ධ වීම.

21) දේශීය සංගීත භාණ්ඩ වර්ගීකරණයට අනුව ඝණ වාද්‍ය භාණ්ඩ දෙකක් ඇතුළත් වරණය තෝරන්න.
I. තාලම්පට - පන්තේරුව II. හක්ගෙඩිය - ගෙජ්ජි
III. තාලම්පට - රබාන IV. පන්තේරුව - බටනලාව


22) පෙරදිග ශාස්ත්‍රීය සංගීතයෙහි මූලික සිද්ධාන්තමය ලක්ෂණය වන්නේ,
I. මෙලඩි ක්‍රමයයි. II. හාර්මනි ක්‍රමයයි. III. අපරදිග ක්‍රමයයි. IV. කර්ණාටක ක්‍රමයයි.


23) වයලින් පවුලට අයත් සංගීත භාණ්ඩ තුනක් ඇති පිළිතුර තෝරන්න.
I. වයලින්, වියෝලා, ගිටාර් II. වියෝලා, චෙලෝ, මැන්ඩලින්
III. චෙලෝ, ඩබල්බේස්, වියෝලා IV. ඩබල්බේස්, ගිටාර්, වයලින්


24) තළ ගීතිකා තාලයට අදාළ කවිය ආරම්භ වන පද පේළිය කුමක්ද?
I. රන් රසා සේම වඩන II. ඉපිද එබෝසත්
III. කොහොව් යනා හඩ නගනා IV. සේවිත පාද සරෝරුහ


• අංක 25 සිට 30 දක්වා ප්‍රශ්න වලට දී ඇති රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.


A


B


C


D


E

25) ඉහත සංගීත භාණ්ඩ නිවැරදිව නම්කර ඇති පිළිතුර තෝරන්න.

I. A ගැටබෙරය B තබ්ලාව C වයලීනය D ගිටාරය E බටනලාව
II. A තබ්ලාව B ගැටබෙරය C වයලීනය D බටනලාව E ගිටාරය
III. A තබ්ලාව B වයලීනය C ගැටබෙරය D බටනලාව E ගිටාරය
IV. A බටනලාව B වයලීනය C ගැටබෙරය D තබ්ලාව E ගිටාරය

26) බටහිර සම්භවයක් ඇති භාණ්ඩ වලට අයත් ඉංග්‍රීසි අක්ෂර යුගලය තෝරන්න.

I. A සහ D II. C සහ D III. B සහ C IV. C සහ E

27) A භාණ්ඩයෙන් හා C භාණ්ඩයෙන් වයන වාදන අංග දෙකක් බැගින් ඇතුළත් පිළිතුර තෝරන්න.

I. ජලා- උපජ් සහ ආලාප - තානාලංකාර
II. ගත් ,රේලා සහ ජලා - තානාලංකාර
III. ගත් - ජලා සහ ආලාප - උපජ්
IV. අලාප - ජලා සහ උපජ් - ගත්

28) B භාණ්ඩය ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය ලෙස යොදා ගන්නා දේශීය නර්තන සම්ප්‍රදාය මින් කුමක්ද?

I. පහතරට
II. සබරගමු
III. උඩරට
IV. කථක්





29) හරිප්‍රසාද් චෞරසියා, උස්තාද් ශබීර් හුසේන් සහ පණ්ඩිත් V.G.ජෝග්, යන ශිල්පීන් ප්‍රවීණත්වයක් උසුලන සංගීත භාණ්ඩ වලට අදාළ ඉංග්‍රීසි අක්ෂර පිළිවෙලින් ඇති පිළිතුර තෝරන්න.

I. A, B, D II. D, A, C III. C, B, D IV. D, A, B

30) දේශීය සංගීත භාණ්ඩ වර්ගීකරණයට අනුව B හා D සංගීත භාණ්ඩ නිවැරදිව වර්ගකර ඇති පිළිතුර තෝරන්න.

I. ආතත, සුෂිර II. සුෂිර, විතතාතත III. ඝණ, ආතත IV. ඝණ, සුෂිර

31) ඩොටඩ් ක්‍රොචට් සංකේතය දැක්වෙන වරණය කුමක්ද?

I. 
II. 
III. 
IV. 

32) දීප්චන්දි තාලය හා ජප්තාලය බටහිර සංගීත ටයිම් සිග්නේචරයෙන් (Time Signature) නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

I. 5/4 , 6/8 II. 7/4 , 4/4 III. 7/4 , 5/4 IV. 7/4 , 3/4

33) G මේජර් (G Major) ස්කේලයට අයත් ස්වර ඇතුළත් පිළිතුර තෝරන්න.

I. G A# B C# D E F G
II. G A B♭ C D E F G
III. G A B C D E F G
IV. G A B C D E F# G

34) නාඩගම් ගීත තුළ දැකිය හැකි විශේෂ වූ ගීතාංගය කුමක්ද?

I. අඩව්ව II. දොහොරාව III. උරුට්ටුව IV. මුද්‍රප්පදය

• අංක 35 සිට 37 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති ගී පාදයන් උපයෝගී කරගන්න.

A. දන්න වංහුං අප කන්නසාමි.....

B. පායාලා අඹරේ චන්ද්‍රයා දිසි.....

C. ගම්වල සැමතැන ඇවිද ගොසින්නේ.....

35) A,B,C අක්ෂර යටතේ එන ගීත ඇතුළත් රංග සම්ප්‍රදායන් පිළිවෙලින් දක්වා ඇති පිළිතුර කුමක්ද?

I. නූර්ති, නාඩගම්, කෝලම්
II. නූර්ති, කෝලම්, නාඩගම්
III. නාඩගම්, නූර්ති, කෝලම්
IV. කෝලම්, නූර්ති, නාඩගම්

36) A අක්ෂරයට අයත් ගීතය ඇතුළත් රංග සම්ප්‍රදායේ දී යොදාගන්නා තාල වාද්‍ය භාණ්ඩය කුමක්ද?

I. පහතරට බෙරය
II. දවුල
III. තබ්ලාව
IV. මද්දලය

37) B අක්ෂරයෙන් දැක්වෙන රංග ශෛලියෙහි සංගීත නිර්මාණයට ආභාෂය කරගත් සංගීත සම්ප්‍රදාය කුමක්ද?

I. හින්දුස්ථානී සංගීතය
II. කර්ණාටක සංගීතය
III. බටහිර සංගීතය
IV. ජන සංගීතය

38) '' සත් සමුදුර '' චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂණය කරන ලද්දේ,

I. පණ්ඩිත් ඩබ්ලිව් ඩී අමරදේව ශූරීන් විසිනි.
II. ආචාර්ය ප්‍රේමසිරි කේමදාස ශූරීන් විසිනි.
III. සරත් දසනායක ශූරීන් විසිනි.
IV. සෝමදාස ඇල්විටිගල ශූරීන් විසිනි.

39) දේශීය සංගීතයේ භාවිතා වන මැදුම් මහ දෙතිතට ගැළපෙන රිද්ම රටාව කුමක්ද?

I. | X X | X X X |
II. | X X X | X X X
III. | X X X X | X X X X |
IV. | X X X | X X X X |

40) විද්‍යුත් සංගීතය, සංධ්වනි (Symphony) වාද්‍ය වෘන්ද සමග මුසුකිරීමේ ගෞරවය හිමිවන සංගීතඥයා දැක්වෙන පිළිතුර තෝරන්න.

I. බීතෝවන්
II. යානි
III. A.R. රහුමාන්
IV. මෝසාර්ට්

* * * * * *

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

| 11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 40 S II |
|---|---|---|
| නම: ............................................ | **පෙරදිග සංගීතය** | කාලය පැය දෙකයි |

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- සියලුම ප්‍රශ්න සඳහා ලකුණු 12 බැගින් හිමිවේ.

01) අංක (i) සිට (iv) දක්වා අසා ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමගින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

i. ''නි ධ , නි රි ග , ප රි ස'' මෙම ස්වර සංගතිය අයත්වන හින්දුස්ථානී රාගය නම් කරන්න.

ii. නිර්දේශිත තාල අතුරෙන් '' බලි'' ස්ථානය හයවන මාත්‍රාවෙහි යෙදෙන හින්දුස්ථානි තාලය නම් කරන්න.

iii. සගරිමග, රිමගපම, යන ස්වර අභ්‍යාසයේ ඊළඟට යෙදෙන ස්වර ඛණ්ඩය ලියන්න.

iv. නිර්දේශිත රාගයක් වන භූපාලි රාගයේ වර්ජිත ස්වර ලියා දක්වන්න.

- අංක (v) සිට (viii) තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීමට පහත සඳහන් ගී පාද උපයෝගී කරගන්න.
  - මල්බර හිමිදිරියේ කොයිබද සමනලියේ
  - දැඩිකල මාතා පෙම්බර මතා
  - මල්සරා බැල්ම හෙලා
  - හනික වරෙව් කොල්ලනේ මෙන්න මෙහෙ වරෙව්
  - ඇසේ මතුවන කඳුළු බිඳු ගෙන

v. දීප්චන්දි තාලයට අනුව ගැයෙන ගී පාදය තෝරා ලියන්න.

vi. ලොස් කැබෙලරොස් සංගීත කණ්ඩායමේ නිර්මාණයක් වන ගීත පාදය තෝරා ලියන්න.

vii. රෝහණ බැද්දගේ ශූරීන් විසින් ජන සංගීතය ඇසුරෙන් නිර්මාණය කරන ලද ගී පාදය කුමක්ද ?.

viii. නව නාට්‍ය ශෛලියට අයත් ගීත පාදය තෝරන්න. (ලකුණු 1 × 8=8යි)

- අංක (ix) සිට (x) දක්වා අසා ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමගින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

ix. ............................ සහ ................................ යන සංගීත භාණ්ඩයන්හි ස්වර පිහිටීම එකිනෙකට සමානය.

x. '' සුදු සඳ එළියේ '' යන ගීතය ............................ චිත්‍රපටයේද '' පාරමිතා බල පූරිත පූජිත '' ගීතය ............................ චිත්‍රපටයේද එන ජනප්‍රිය ගීත දෙකකි. (ලකුණු 2×2=4යි) (මුළු ලකුණු 12යි)

02) i. පහත A, B, C අක්ෂර යටතෙහි දැක්වෙන රාග සංගති වලින් පිළිඹිබු වන හින්දුස්ථානී රාග තුනෙහි නම් අදාළ ඉංග්‍රීසි අක්ෂරයද සමග ලියන්න. (ලකුණු 3 යි)

A. සරිස, මගමරි, ගප, ධනිස් B. සරිස, නිසගමප, මග, මධනිස් C. නිරිස, නිරිග, ම'ග, ම'ධ නිධස්

ii. ඉහත රාග තුනෙන් ඔබ කැමති රාගයක් නම් කර ඊට අයත් මධ්‍යලය බයාල් ගීතයක / ලක්ෂණ ගීතයක හෝ මධ්‍යලය වාදිතයක ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කර, මාත්‍රා අටකට නොඅඩු තානාලංකාර දෙකක් තාල්‍යානකූලව ප්‍රස්ථාර කරන්න. (ලකුණු 6 යි)

iii. ඉහත (ii) කොටසේදී තෝරා නොගත් රාග දෙකින් කැමති රාගයක් නම් කර ජප් තාලයේ එක් ආවර්තයකට ගැළපෙන ලෙස තානාලංකාරයක් තාලානුකූලව ප්‍රස්තාර කරන්න.

03) පහත වගුවෙහි සඳහන් විස්තර ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| රාගය | රාග විස්තරය |
|---|---|
| A | **ගානසමය_රාත්‍රී ප්‍රථම ප්‍රහරය වන මෙම රාගයේ ගාන්ධාරය සහ නිෂාදය වාදී සංවාදී ස්වර වේ.** |
| B | **සස රිරි ගුගු මමප යන ස්වර මුඛ්‍යාංග ස්වර ලෙස යෙදෙන මෙම රාගයේ ගානසමය රාත්‍රී තුන්වන ප්‍රහරයයි.** |

i. ඉහත දැක්වෙන රාග විස්තර අනුව A සහ B රාග දෙක අදාල ඉංග්‍රීසි අක්ෂරයද සමග නම් කරන්න. (ලකුණු 2)

ii. ඉහත රාග දෙකින් කැමති එක් රාගයක් තෝරාගෙන මධ්‍යලය ගීතයක / ලක්ෂණ ගීතයක හෝ වාදිතයක ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 4 යි)

iii. ඉහත (ii) කොටසට තෝරා නොගත් රාගයට අයත් මාත්‍රා 16කට නොඅඩු තානාලංකාරයක් තාලානුලකූලව ප්‍රස්තාර කරන්න. (ලකුණු 3 යි)

iv. දීප්චන්දී තාලය නිවැරදි තාල සංඥා සමගින් ප්‍රස්තාර කරන්න. (ලකුණු 3යි)

(6) WWW.PastPapers.WiKi (5)



Download Term Test Papers, Short Notes From One Place!

04) i. ගැමි ගී වර්ගීකරණයට අදාළ තොරතුරු පහත වගුවෙහි දක්වා ඇත. හිස්තැන්වලට ගැළපෙන පිළිතුරු අදාළ අංකයද සමග පිළිතුරු පත්‍රයෙහි ලියන්න. (ලකුණු 4 යි)

| | ගැමි ගී වර්ගය | නිර්මාණයට පදනම් වූ හේතු සාධක | ගීතවල විශේෂත්වය | උදාහරණ ලෙස ගතහැකි ගැමි ගී පාද |
|---|---|---|---|---|
| A | මෙහෙ ගී | (i)............................................ | අනාසාතාත්මක | (ii) ................................................ |
| | | | අසාතාත්මක | රන් දැකැති ගෙන තිති සැරසෙනවා |
| B | (ii)...................... | (iv)............................................ | (v) ............................ | එක පඳුරෙන් ලී සයක් කපාගෙන |
| | | | දරු නැලවිලි ගී | (vi).......................... |
| C | ඇදහිලි ගී | ඇදහිලි හා විශ්වාස මත නිර්මාණය වූ | (vii)......................... | බුද්ධං සරණේ සිරස දරාගෙන |
| | | | ශාන්තිකර්ම ගී | (viii)......................... |

ii. සේගී වල දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 3 යි)

iii. '' උදයට පායන හිරු දෙවියන්ටයි'' යන ගීතයේ සඳැස්මත් සහ ගීමත් ගණන පිළිවෙලින් ලියන්න. (ලකුණු 2 යි)

iv. සබරගමු වන්නම් හෝ පහතරට සින්දු වන්නම් පිළිබඳ කරුණු තුනක් ලියා දක්වන්න. (ලකුණු 3 යි)

05) ශ්‍රී ලංකාවේ රංග ශෛලීන් තුනකට අයත් තොරතුරු පහත දක්වා ඇත. ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A. පහතරට බෙරය ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය ලෙස භාවිතා කරන අතර හාස්‍ය රසය ගැබ් වූ රංග ශෛලියකි.

B. දොන් පිලිප්පු සිඤ්ඤෝ නම් ශ්‍රී ලාංකීය නිර්මාණකරුවා දායකත්වය දැක්වූ මෙම රංග ශෛලියෙහි රංග භූමිය ''කරලිය'' නම් වේ.

C. නීතිඥ ජෝන්ද සිල්වා ශූරීන් පුරෝගාමී මෙහෙවරක් සිදුකල මෙම රංග ශෛලිය ශාලාවක් තුළ වේදිකා ගත විය.


i. ඉහත තොරතුරු වලින් කියවෙන රංග ශෛලීන් තුන ඊට අදාළ ඉංග්‍රීසි අක්ෂරයද සමග නම් කරන්න. (ලකුණු 3 යි)

ii. B හා C අක්ෂර වලට අදාළ රංග ශෛලීන් දෙකෙහි සංගීතමය ලක්‍ෂණ හතරක් සන්සන්දනාත්මකව ලියන්න. (ලකුණු 4 යි)

iii. A අක්ෂරයට අයත් රංග ශෛලියේ එන ගීතයක මුල්පාද දෙකක් ලියන්න. (ලකුණු 2 යි)

iv. C රංග ශෛලියට භාවිතා කරන ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩයේ දළ රූප සටහනක් ඇඳ කොටස් දෙකක් නම් කරන්න. (ලකුණු 3 යි)

06) පහත දැක්වෙන අපරදිග ස්වර ප්‍රස්තාර කොටස ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




i. ඉහත අපරදිග ස්වර ප්‍රස්තාර කොටස පෙරදිග ක්‍රමයට පෙරලා තාලානුකූලව ප්‍රස්තාර කරන්න. (ලකුණු 8 යි)

ii. ඉහත අංක 01 සිට 04 දක්වා අංක කර ඇති සංකේත පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 1/2 x 4 = 2 යි)

iii. ඉහත ඔබ පෙරදිග ක්‍රමයට ලියූ ස්වර ප්‍රස්තාරයේ පළමු විභාග 04කට අයත් ස්වර පමණක් මධ්‍යම භාවයට පෙරලා ප්‍රස්තාර කරන්න.

07) පහත සඳහන් මාතෘකා අතරින් තුනක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

i. කැමති ස්වර වාද්‍ය භාණ්ඩයක දළ රූප සටහනක් ඇඳ එහි ශුද්ධ ස්වර හත පිහිටන ස්ථාන සලකුණු කරන්න (ලකුණු 4 යි)

ii. මුල් යුගයේ ගුවන් විදුලි සරල ගීත, එහි ආරම්භය, ගායික ගායිකාවන්, සහ ගීත කිහිපයක් ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4 යි)

iii. නාදයේ ත්‍රිවිධ ගුණ නම් කරන්න, ඉන් එකක් පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු4 යි)

iv. බටහිර සංගීතඥ මෝසාර්ට් විසින් සංගීතයට සිදුකළ සේවාව. (ලකුණු 4 යි)

v. W.B. මකුලොලුව ශූරීන් විසින් සිදුකළ සංගීතමය සේවාව. (ලකුණු 4 යි)

vi. පරිගණක සංගීත නිර්මාණයට යොදාගන්නා මෘදුකාංග දෙකක් නම් කරමින් සංගීත විෂය සඳහා ප්‍රයෝජනවත් මෙවලමක් ලෙස පරිගණකය භාවිතා කළ හැකි ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

PAST PAPERS WIKI

* * * * * *



(6) WWW.PastPapers.WiKi (6)
Download Term Test Papers, Short Notes From One Place!

## 11 ශ්‍රේණිය පෙරදිග සංගීතය I පත්‍රය - පිළිතුරු

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. ii | 2. iii | 3. iv | 4. i | 5. ii | 6. ii | 7. iii | 8. ii |
| 9. iv | 10.i | 11. ii | 12. iv | 13. iii | 14. ii | 15. ii | 16.iii |
| 17.iv | 18.i | 19.iv | 20.ii | 21.i | 22.i | 23.iii | 24.iv |
| 25.ii | 26.iv | 27.ii | 28.iii | 29.ii | 30.i | 31.iv | 32.iii |
| 33.iv | 34.iii | 35.i | 36.iii | 37.ii | 38.iv | 39.iv | 40.ii |

## 11 ශ්‍රේණිය පෙරදිග සංගීතය II පත්‍රය - පිළිතුරු

01) i. යමන් රාගය ii. ජප් තාලය iii. ගමපධප iv. ම, නි v. ඇසේ මතුවන කඳුළු බිඳු ගෙන
vi. මල්බර හිමිදිරියේ vii. මල්සරා බැල්ම හෙලා viii. හනික වරෙව් කොල්ලනේ (1×8 = ලකුණු 08)
ix. සිතාරය, එස්රාජය x. රේබාව, රන්මුතුදූව (2 × 2 = ලකුණු 04)

02) i. A බිලාවල් රාගය B භෛරවී රාගය C යමන් රාගය (ලකුණු 03යි)
ii. රාග දෙකෙන් එකකට අයත් මධ්‍යාලය/ලක්ෂණ ගීත හෝ වාදිතයක ස්ථායි කොටස ප්‍රස්තාර කිරීමට.
(ලකුණු 06යි.)
iii. පරප්තාලයට අනුව නිවැරදිව තානාලංකාරයක් ලිවීමට (ලකුණු 03යි.)

03) i. A යමන් රාගය B කාෆි රාගය (ලකුණු 02යි.)
ii. කැමති රාගයක මධ්‍යලය / ලාක්ෂණ ගීත / වාදනය ස්ථායි කොටසක් නිවැරදිව ප්‍රස්තාර කිරීමට (ලකුණු 04යි.)
iii. තෝරාගත් රාගයට අදාළව මාත්‍රා 16 තානාලංකාරයක් ලිවීමට (ලකුණු 03යි.)
iv. දීපචන්දි තාලය තාල සංඥා සමග ප්‍රස්තාර කිරීමට (ලකුණු 03යි.)

04) (i) i. වෘත්තීන් මත පදනම්ව ii. සුදුසු අනාසාතාත්මක ගීත පදයක් ලිවීමට iii. සමාජීය ගීත
iv. විනෝදාස්වාදය සහ සමාජ අවශ්‍යතා මත v. කෙලි ගීත
vi. සුදුසු දරු නැලවිලි ගීයක් ලියා තිබිය යුතුය. vii. තුන්සරණේ ගීත.
viii. සුදුසු ශාන්තිකර්ම ගීයක් ලියාතිබීමට (1/2 × 8 = ලකුණු 04)

i. සුවිශේෂී ලක්ෂණ තුනක් ලිවීමට (ලකුණු 03යි.)
ii. සඳැස්වන් 16යි ගීමත් 24. (ලකුණු 02යි)
iii. පහතරට සින්දු වන්නම් පිළිබඳ කරුණු 03ක් ලිවීමට (ලකුණු 03යි.)

05) i. A -කෝලම් B-නාඩගම් C - නූර්ති (ලකුණු 03යි.)
ii. නාඩගම් හා නූර්තිවල කරුණු 04ක් සන්සන්දනය කර ලිවීමට. (ලකුණු 04යි.)
iii.කෝලම් ගීයක මුල්පාද දෙක ලිවීමට. (ලකුණු 02යි.)
iv. තබ්ලාවේ දළ රූපසටහනක් ඇඳීමට සහ කොටස් නම් කිරීමට. (ලකුණු 03යි.)

06) i. + ග පධ පම | ග - රිස නිස | ගම ධ -|-- ප -
පම ගරි + + | ග ම ප ධධ | නි - ධ ධ |ස් - - - (ලකුණු 08)

ii. 1) ක්‍රොචට් රෙස්ට් මාර්ක් (Crotchet Rest Mark)
2) සෙමිබ්‍රීව් (Semibreve)
3) ට්‍රෙබල් ක්ලෙෆ් (Treble clef)
4) ටයි මාර්ක් (Tie Mark) (1/2 × 4= 2)

iii. + ධ ස්රි ස්නි | ධ - පම ගම | ධ නි රි - | ස් - - - (ලකුණු 02)

07) කැමති ප්‍රශ්න තුනකට පිළිතුරු ලිවීමට ලකුණු (4 × 3 = 12)

PAST PAPERS WIKI


(1) WWW.PastPapers.WiKi (1)
Download Term Test Papers, Short Notes From One Place!


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න